**බොරලැස්ගමුව නගර සභාව - 2023**

----------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

බොරලැස්ගමුව නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශය,ශුද්ධවත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශ වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශ වලින් 2023 දෙසැම්බර් 31 දිනට බොරලැස්ගමුව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂය තුළ ලැබී තිබුණු රු.1,321,200 ක් වූ ව්‍යාපාර බදු ආදායම මුදල් ගිණුමටද වරිපනම් ණයගැති ගිණුමට ද හර කර තිබුණි. | වර්ෂය තුළ ලැබුණු රු.1,321,200 ක ව්‍යාපාර බදු ආදායම නිවැරදිව සටහන් කර ඇති බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | මෝටර් රථ හා පුස්තකාල පොත් වලට අදාළව 2022 වර්ෂයේ වැඩිපුර ක්ෂය ගිණුමට ගලපා තිබුණු රු.471,733 ක් 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී නිවැරදිකර නොතිබුණි. | මෙම වරද 2024 ගිණුම් මඟින් නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | 2021 වර්ෂයේ ගිණුම්ගත නොවූ රු.1,196,310 ක් වූ පොදු වැසිකිලියේ වටිනාකම සහ 2022 වර්ෂයේදී රු.925,497 ක පිරිවැයක් දරා කාර්යාල පරිශ්‍රයේ ඉදි කර තිබූ කාන්තා වැසිකිලියේ වටිනාකම ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | ප්‍රාග්ධනිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු වෙන් කිරීම සිදු කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා විගණන ගාස්තු ලක්ෂ 12 ක් වෙන් කර ඇති බව. | විගණන ගාස්තු සඳහා වෙන් කිරීම් කළ යුතුය. |
| (ඉ) | ඍජු බැර රු.133,599 ක් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | 2023.12.31 දිනට පොදු ගිණුමේ බැංකු සැසඳුමට අනුව, ඍජු බැර රු.133,598.85 ක් බව. | ඍජු බැර හඳුනා ගෙන ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳුණු පාලන ගිණුම් හෝ වාතර්ා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ගිණුම් විෂයන් 04 කට අදාළ ශේෂයන් ඒවාට අදාළ උපයෝගී ලේඛන/ වාර්තාවල දැක්වෙන ශේෂයන් සමඟ සැසඳීමේදී රු.5,809,154 ක වෙනසක් විය. | ඉදිරියේදී මේ පිළිබඳ සොයා බලා කටයුතු කරන බව. | වෙනස්කම් වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ගිණුම් විෂයයන් 02 කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් ලෙජරය සමඟ සැසඳීමේදී රු.12,256,410 ක වෙනසක් විය. | නිවැරදි කරන බව. | -එම- |
| (ඇ) | ණයගැති ලැබීම් උපලේඛනය අනුව ස්ථාවර තැන්පතු පොලී ලැබීම් රු.829,289 ක් වූ අතර ලෙජරයට පිටපත් කිරීමේදී රු.571,907 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව රු.257,382 ක වෙනසක් නිරීක්ෂණය විය. | සොයා බලා ඉදිරියේදී කටයුතු කරන බව. | -එම- |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| | විෂයය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ආයුර්වේද තොග ගිණුම | 306,889 | උපලේඛන ය | ඉදිරියේදී මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන බව. | ගිණුම් ශේෂවලට අදාළව උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | විමධ්‍යගත ණයගැතියෝ | 12,399,853 | -එම- | -එම- | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ඇ) | ලැබිය යුතු සේවා ගාස්තු | 250,800 | -එම- | -එම- | -එම- |
| (ඈ) | හඳුනාගත් ප්‍රාග්ධන ප්‍රධාන | 1,848,300 | -එම- | -එම- | -එම- |
| (ඉ) | අවිනිශ්චිත ගිණුමේ ශේෂය | 152,658 | කපා හැරීම සම්බන්ධ තොරතුරු | මෙය නිරවුල් කිරීම සිදු කරගෙන යන බව. | ගිණුම්කරණ දෝෂ නිවැරදිව සොයා ගෙන නිවැරදි කිරීම් කළ යුතුය. |
| (ඊ) | හඳුනා නොගත් ගිණුමේ ශේෂය | 224,217 | -එම- | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ වියදම ඉක්මවූ ආදායම රු.51,899,404 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ වියදම ඉක්මවූ ආදායම රු.49,306,548 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම් ,බිල්කළ ආදායම් ,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තු ගත ආදායම (රු) 000‘ | බිල්කළ ආදායම (රු) 000‘ | රැස්කළ ආදායම (රු) 000‘ | දෙසැම්බර් 31දිනට මුළු හිඟය (රු) 000‘ | ඇස්තමේන්තු ගත ආදායම (රු) 000‘ | බිල්කළ ආදායම (රු) 000‘ | රැස්කළ ආදායම (රු) 000‘ | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය (රු) 000‘ |
| වරිපනම් හා බදු | 28,000 | 27,962 | 30,017 | 14,870 | 27,300 | 27,664 | 32,023 | 27,136 |
| කුලී | 990 | 990 | 913 | 77 | 990 | 990 | 1,012 | 371 |
| බලපත්‍ර ගාස්තු | 750 | 307 | 307 | - | 750 | 238 | 238 | - |
| වෙනත් ආදායම් | 1,070 | 2,219 | 2,219 | - | 1,250 | 1,149 | 1,149 | - |
| එකතුව | 30,810 | 31,478 | 33,456 | 14,947 | 30,290 | 30,041 | 34,422 | 27,507 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | ඉකුත් වර්ෂය අවසානයට රු.27,136,510 ක් වූ වරිපනම් ණයගැති ශේෂයෙන් රු.14,870,430 ක් හෙවත් සියයට 55 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | ඉකුත් වර්ෂයේ බිල් කරන ලද ආදායමින් මේ වන විට 42% ප්‍රමාණයක් අය කර ගෙන ඇති බව. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක සීඩී.2/3/101 දරන චක්‍රලේඛය ප්‍රකාරව දේපල වර්ෂ 5 කට වරක් තක්සේරු කර වරිපනම් බදු අය කළ යුතු වුවද සභාව විසින් 2009 වර්ෂයෙන් පසු දේපළ තක්සේරු කර නොතිබුණි. | 2020 වර්ෂයේ ආරම්භ කරන ලද නව තක්සේරු කටයුතු කෝවිඩ් වසංගතය හමුවේ නවතා දැමූ පසු යළිත් 2023 වර්ෂයේ මැයි මස ක්‍රියාත්මක කර නව තක්සේරු අගයන් මත වරිපනම් අය කිරීම 2024 වර්ෂයේ ජනවාරි මස සිට සිදු කරනු ලබන බව. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට රු.100,000 ට වැඩි දේපළ 06 කින් රු.1,324,207 ක් ද රු.50,000 ත් රු.100,000 ත් අතර දේපළ 10 කින් රු.727,121 ක් ද වරිපනම් හිඟ හිටිව පැවතුණි. | දේපළ කිහිපයක මුදල් අය වී ඇති අතර 2019.12.31 චක්‍රලේඛයට අනුකූලව කටයුතු කරමින් පවතින බව අනෙකුත් දේපළ සඳහා, දේපළ තහනම් කිරීමේ කටයුතු රතු නිවේදන ලබා දීම මඟින් සිදු කරමින් පවතින බව. | හිඟ වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| **(ආ)** | **කුලී** | | |
| (i) | 2023 දෙසැම්බර් 31 දිනට මාස 01 සිට 15 දක්වා කාලපරාසයක කඩ කාමර 18 ක හිඟ හිටි කඩ කුලී ආදායම රු.242,995 ක් වූයෙන් කඩකුලී නොගෙවන වෙළඳසැල්වල අයිතිය ගිවිසුම් ප්‍රකාරව නැවත නගර සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නව ගිවිසුම සකස් කිරීමේදී එහි ගිවිසුම් කාලය මාස 03 ක් ලෙස සංශෝධනය කර ඇත. කඩ කුලී හිඟ මුදලින් අය වීමට ඇති මුදල ඉදිරියේ දී අය කර ගැනීමට කටයුතු කරන බව. | හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | සෑම ගොඩනැගිල්ලකට, ඉඩමකට අදාළව ගිවිසගත් දිනෙන් සෑම වසර තුනකට වරක් මාසික කුලිය රජයේ | මාර්ග සංවර්ධනයේ දී ඉඩ කඩ මදි වීම හා නිසි පරිදි නඩත්තු කිරීමක් නොකර ඇති බැවින් කඩ හිමියන් | වසර 03 කට වරක් දේපළ තක්සේරු කර කුලිය |

| | | | |
|---|---|---|---|
| | තක්සේරුකරුගේ හෝ වරලත් තක්සේරුකරුවකුගේ හෝ තක්සේරුව මත ප්‍රතිශෝධනය විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදීත් කඩ කාමර 48 ක් 2009 වර්ෂයේ මාසික සංශෝධිත ගාස්තු මත කඩකුලී අය කර ගෙන තිබුණි. | ගිවිසුම් ගත වීමට අකමැත්ත ප්‍රකාශ කර සිටින අතර, තක්සේරු කිරීමට යාමෙන් කඩ ගිවිසුම්ගත වන්නන් අධෛර්යමත් වන බැවින් එය ඉදිරියේදී සිදු කිරීමට කටයුතු කරන බව හා දැනට කඩහිමියන් 80% පමණ නව ගිවිසුම්ගත වීම සිදු කර ඇති අතර ඉදිරියේදී එය සම්පූර්ණ කිරීමට කටයුතු කර පසුව නව තක්සේරුවකට යාම සුදුසු බව. | සංශෝධනය කළ යුතුය. |

**3 මෙහෙයුම් සමාලෝචනය**

**3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ රු.14,903,707 ක් වැය කර, දිරන කසළ ටොන් 6865 ක් ද නොදිරන කසළ ටොන් 1754 ක්ද කරදියාන කසළ අංගනයට බැහැරකර තිබුණි. දිරන කසළ විකිණීම සඳහා හෝ කොම්පොස්ට් ව්‍යාපෘතියක් මඟින් පොහොර නිෂ්පාදනය කිරීමට කටයුතු කිරීම තුළින් කසළ බැහැර කිරීම සඳහා දරන වියදම් අවම කර ගැනීම සඳහා සභාවේ අවධානය යොමු කර නොතිබුණි. | ඉදුල් කසළ විකුණා සභාවට ඉදිරියේදී ආදායම් උපයා ගැනීමට සැලසුම් කර ඇති අතර කොම්පොස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට සභාව සතුව ඉඩමක් නොමැති බව හා නොදිරන කසළ විකුණා ආදායමක් ලබා ගන්නා බව. | කසළ වියදම් අවම කර ගනිමින් කසළ තුළින් ආදායමක් ඉපයීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2023 වර්ෂ තුළ ව්‍යාපාරික ආයතන 26 ක කසළ ඉවත් කිරීමෙන් රු.633,000 ක ආදායමක් ලබා ගෙන තිබූ නමුත් ආදායම් එකතු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථාවක් සම්මත කර ගෙන නොතිබුණි. | ඝණ අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ කාර්යයන් විධිමත් කිරීම සඳහා භාෂාත්‍රයෙන් යුතුව සකස් කරන ලද අතුරු ව්‍යවස්ථාව පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත යොමු කර ඇති බව. | අතුරු ව්‍යවස්ථාව සම්මත කර ගත යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ සිට පැවත එන රු.40,610 ක් වටිනා ණය හිමි ශේෂ දෙකක් ද 2019 සිට පැවත එන රු.613,957 ක් වටිනා ණය | ඉදිරියේදී ණය හිමි ශේෂ නිරාකරණය කර ගැනීමට සුදුසු කටයුතු සිදු කරන බව. | ණය හිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | හිමි ශේෂ 17 ක් ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 2023 වර්ෂයේදී කල් පිරෙන රු.1,830,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 04 ක් වැඩි පොලී අනුපාතයක් යටතේ ආයෝජනය කිරීමට කටයුතු නොකර පෙර පැවති සියයට 5.22 ක පොලී අනුපාතයක් යටතේම ආයෝජනය කර තිබුණි. | නව පොළී ප්‍රතිශතයක් යටතේ විවෘත කිරීමට කළමනාකරණ කමිටුවට යොමු කිරීමෙන් පසුව එහි අනුමැතිය යටතේ නැවත ගිණුම් ආරම්භ කිරීමට කටයුතු කරන බව. | වැඩි පොලී අනුපාතයක් යටතේ ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය අනුව මූලා ප්‍රකාශ වල දැක්වෙන ඉඩම් 29 කින් ඔප්පු ලබාගෙන තිබුණේ එක් ඉඩමක් සඳහා පමණි. | සභාවේ ඉඩම් 12 ක මිනුම් වාර්තා ලැබී නොමැත. එම වාර්තා ලැබූ වහාම ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කරන බව. | ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නාගරික සංවර්ධන අධිකාරිය විසින් බොරලැස්ගමුව නගර සභාවේ බහු කාර්ය ගොඩනැගිල්ල දෙවන මහල, ස්ලැබ් මට්ටම දක්වා ඉදි කර තිබුණද ඉදිකිරීම් කටයුතු 2022 අගෝස්තු මස සිට තාවකාලිකව නතර කර තිබුණි. එම තත්ත්වයෙන් වූ ගොඩනැගිල්ල 2023 පෙබරවාරි 09 දින සභාව වෙත තාවකාලිකව භාර දී තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් නැවත වැඩ ආරම්භ කර නොතිබුණි. ඉදිකිරීම් නැවත ආරම්භ වීම ප්‍රමාද වීමෙන් ගොඩනැගිල්ල සඳහා මේ දක්වා වැය කර තිබුණු රු.248,789,106 ක වියදම නිෂ්කාර්යය වියදමක් විය හැකි අතර ගොඩනැගිල්ලේ කම්බි ආදිය දිරාපත් වෙමින් ද පැවතිණි. | නාගරික සංවර්ධන අධිකාරිය මඟින් සැලසුම් කර ඉදිකිරීම් සිදුකළ අතර රටේ පවතින තත්ත්වය සලකා නාගරික සංවර්ධන අධිකාරිය හා කොන්ත්‍රාත්කරුගේ එකඟතාවය මත කොන්ත්‍රාත් වැඩ කොටස් අඩුකර අවසන් කිරීමට කටයුතු කර ඇති බවත් සංශෝධිත සැලසුම් හා සකස්කළ ඇස්තමේන්තුව මත ඉතිරි කොටස සකස් කිරීම කරන බවත් නාගරික සංවර්ධන අධිකාරියේ 2023.10.23 දිනැති ලිපිය මඟින් දන්වා ඇති අතර ඉහත කරුණු සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරිය හා අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව. | ගොඩනැගිල්ලේ වැඩ අවසන් කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) නාගරික සංවර්ධන අධිකාරිය සමඟ නගර සභාව පවත්වාගෙන යන බද්ධ ගිණුමෙන් නාගරික සංවර්ධන අධිකාරියේ අනුමත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂය තුළ රු.24,000,000 ක මුදලක් සභාව වෙත ලබා දී තිබුණද එකී අරමුදල් වලින් රු.10,000,000 ක ව්‍යාපෘති 02 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. | රු.10,000,000 කින් ව්‍යාපෘති 02 ක වැඩ 2023 වර්ෂයේ දී අවසන් කර ඇති අතර රු.14,000,000 ට අදාළ ව්‍යාපෘති 2024 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇති බව. | අදාළ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**3.5 වාහන පද්ධති කළමණාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව භාවිතා කරන වෙනත් ආයතන නමට ලියාපදිංචි වී ඇති වාහන 06 ක අයිතිය නගර සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අයිතිය නගර සභාව වෙත පවරා ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින බව. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |